*ප්‍රශ්නයඃ ස්වාමින් වහන්ස අද, තාක්‍ෂණ යුගයේ දී, මම හිතන්නේ බුද්ධ ධර්මයට ඉදිරියට එන්න සෑහෙන්න අවස්ථාවක් තියෙනවා. එන්න එන්න බටහිර සමාජයේ වුනත් පුද්ගලයන් බුද්ධාගම ගැන උනන්දුවක් දක්වනවා. ඔබ වහන්සේට පෙනෙන විදියට ඒ හරහා අපට තිබෙන අවස්ථා මොනවාද ?*

පිළිතුර : ඇත්ත වශයෙන්ම විද්‍යාව සහ තාක්‍ෂණය දියුණු වීමත් සමග බුදු හාමුදුරුවෝ දේශනා කළ සංකල්ප වල වටිනාකම අද තවත් තහවුරු වෙලා.

උදාහරණයක් ලෙස සාපේක්‍ෂතා වාදය ගැන සැලකුවහොත්, හේතු ඵල වාදය, නූතන තාක්‍ෂයේ හා විද්‍යාවේ දී තහවුරු කරලා තියෙනවා. හැම දෙයක්ම ලෝකයේ එකිනෙකට සාපේක්‍ෂව පවතිනවා කියලා.
මිනිසුන්ට වුනත් පරිසරයත් එක්ක සාපේක්‍ෂ වුනේ නැතිනම්, ජීවත් වෙන්න බැහැ. හුදෙකලා වෙනවා. එවගේම පරිසරයටත් ජීවීන්ගේ අවශ්‍යතාවය තියෙනවා. අපි ඒ වගේ සිද්ධාන්ත ගත්තොත් ඒ සිද්ධාන්ත තුළ පෙන්නුම් කරන්නේ බුදු හාමුදුරුවෝ දේශනා කළ ධර්මයේ තියෙන ප්‍රයෝගික වටිනාකමයි. උන්වහන්සේ දේශනා කළේ නිර්වාණය ඉලක්ක කරගෙන. නමුත් සිද්ධාන්තය අපට ඕනෑම දෙයකට ආදේශ කරන්න පුළුවන්. ඒ නිසා ඒ තුළ වටිනාකමක් අපිට දක්නට තියෙනවා. දැන් අපි ගත්තොත් එහෙම චතුරාර්ය සත්‍ය, ඒ තුළ තියෙනවා දුක්ඛ සත්‍ය, සමුදය සත්‍ය, නිරෝධ සත්‍ය, මාර්ග සත්‍ය කියලා. මේ සතර සත්‍ය තුළ ප්‍රකාශ වන කරුණු හතරක් තියෙනවා. එකක් තමයි දැනිම. දුක්ඛ සත්‍ය කියලා කියන්නේ දැනීම. සමුදය සත්‍ය කියන්නේ බැහැර කිරීම. නිරෝධ සත්‍ය කියන්නේ සාක්ෂාත් කිරීම - ළඟා කර ගැනීම. ඊළගට මාර්ග සත්‍ය කියන්නේ භාවිතා කිරීම. මේක න්‍යායක්. මේ න්‍යාය මේ ලෝකයේ තියෙන ඕනෑම භෞතික නැතිනම්, රටක දියුණුවට වුනත් අපිට ආදේශ කරන්න පුළුවන්.

*ප්‍රශ්නය : ස්වාමින් වහන්ස ජාත්‍යන්තර සමාජයට මේ අදහස ගෙනියන්න පුළුවන් කොහොමද? මම හිතන්නේ ශ්‍රී ලංකාවේ අපට යුතුකමක් තියෙනවා ඒ ක්‍රියා මාර්ගයට ඇතුල් වෙන්න. කොහොමද ඒක කරන්න පුළුවන්?*

පිළිතුර : ඇත්ත වශයෙන්ම මේ දර්ශනය ලෝකයට කියා දීම වැදගත්. රූපවාහිනිය තියෙනවා. ගෝලීය කරණය කියලා අලුත් සංකල්පයක් තියෙනවා. අද විවිධ දියුණු රටවල් භාවිතා කරන මාධ්‍ය තියෙනවා. ඒවා උපයෝගි කරගෙන යම් යම් වැඩසටහන් ගෙනියනවා නම් මම හිතනවා වේගයෙන් අපිට මේ අදහස ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ දවස් වල තිබුණේ පත පොත විතරයි. සාකච්ඡා පමණයි. එහි එක්තරා විධියක දුරස්ථ භාවයක් තියෙනවා. අද එහෙම නෙමෙයි. අද රූපවාහිනිය, පරිගණකය ආධාර කරගෙන අපිට ධර්මය පතුරවන්න පුළුවන්.

කෙනෙකුට බුදු සමය පිළිබඳව යම්කිසි ගැටලුවක් තිබුණොත් එහෙම සෘජුව අහන්න පුළුවන්. උත්තර ලැබෙන ක්‍රම සකස් කරන්න පුළුවන්.

*ප්‍රශ්නය : අපිට අපේ සමාජය දිහාත් බලන්න වෙනවා. කැඩපතක් ඉදිරියට ගියොත් අපේ සමාජයට ම සමහර වේලාවට අපිටත් දැනෙනවා අපි ධර්මය පදකක්මක් ලෙස පළදිනවා මිස අනුගමනය කරන්නේ නැහැ. එක අතකින් අපි පන්සිල් ගන්නවා ඒ වගේම අපේ අභ්‍යන්තරව බැලුවොත් පිරිත් කියන අතරතුර මත්පැන් ගන්නවා. ඒ වගේම සමාජයේ තියෙන අපරාධ, සමාජයේ හැසිරීම් රටාවන් පුදුමයි. සමාජය හදන්න අපේ බෞද්ධ පරිසරයට සම්පූර්ණයෙන්ම නොහැකි වෙලා තියෙනවා. ඒකට කාරණාව?*

පිළිතුර : මම දකින්නේ පරමාදර්ශී සමාජයක් නැතිකම. අපි ළමයෙකුට කියනවා පන්සිල් රකින්න කියලා. ළමයෙකුට අවට පරිසරයට ගියොත් පන්සිල් රකින කෙනෙක් දකින්න නැහැ. අපිට පුළුවන් නම් බෝසත් සමාජයක්, එහෙම නැත්තම් පරමාදර්ශී සමාජයක් හදලා දෙන්න, අන්න ඒක වැදගත්.

*ප්‍රශ්නය : ඒක ප්‍රයෝගිකව කරන්නේ කොහොමද ස්වාමින් වහන්ස?*
පිළිතුර : මම හිතනවා කුඩා ඒකකයකින් පටන් ගන්න ඕන.

*ප්‍රශ්නය : නායකත්වය දෙන්න හැකි ස්වාමින් වහන්සේලාට ද? ඔබ වහන්සේට පෙනෙන විධියට සිවිල් සමාජයේ ගිහි නායකයන්ටද? නැතිනම් දෙපිරිසම එකතු වෙන්න අවශ්‍යද?*

පිළිතුර : මම හිතනවා කණ්ඩායම් දෙකම එකතු වෙන්න ඕනේ. භික්ෂූන් වහසේලාට ඒක නිර්මාණය කරන්න පුළුවන්, නමුත් පවත්වාගෙන යන්න ගිහි සමාජය අවශ්‍යයි. භික්ෂූන් වහන්සේලාට මේ වගකීමෙන් බැහැර වෙන්න බැහැ. නමුත් අපි සියලු දෙනා එකතු වී ඒ සමාජය බිහි කරන්න අවශ්‍යයි. ඇත්ත වශයෙන්ම පොහොය දවසේ සිල් සමාදන් වන සංකල්පය ගත්තත් එහි පරම අදහස තමයි අඩුම තරමින් ඒ දවසෙවත් කැප වීම. නමුත් අද ඒකවත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

*ප්‍රශ්නය : කොහොමද ඒ පණිවිඩය සමාජයට දෙන්න පුළුවන්?*

පිළිතුර : මම දකින වැදගත්ම කාරණාව, පොහොය දවසට සිල් ගන්න කණ්ඩායම් කිහිපයක් ඉන්නවා. වයෝවෘද්ධ, මැදි වියේ, තරුණ, ළාබාල පිරිස් ඉන්නවා.

චෝදනාවක් නෙමෙයි. නමුත් වැඩිහිටි අය ආදර්ශවත් වෙන්න උවමනායි. නමුත් ඒ ආදර්ශවත් භාවය එතැන දකින්නට නැහැ. එහෙම වුනා නම් අලුත් පරම්පරාව හොඳ දේ අනුගමනය කරනවා. එයින් මේ ඒකක හතරම සම වගකීමක් දරන්න හුරු වෙනවා. මම දකින විදියට වයෝවෘද්ධ පිරිස තුළ යම් යම් පුරුදු තියෙනවා. දැන් මෙතන තියෙන්නෙ පුරුදු පිළිබඳ සටනක්. අපි නව පුරුද්දක් ආදේශ කරන්න මහන්සි ගන්නවා. නමුත් ඒ අය අවුරුදු 50 ක් 60 ක් තිස්සේ හුරුවුන පුරුදු සමූහයක් තියෙනවා. ඒක කඩාගෙන යන්නට හැකියාවක් නැහැ. ඒක තමයි අවශ්‍ය කරන දේ. මම හිතනවා මේ වෙනස කරන්න අවබෝධය අවශ්‍ය වෙනවා.

බුද්ධාගමේ සූත්‍රයක් තියෙනවා අනංගන සූත්‍රය කියලා. ඒ අනංගන සූත්‍රයේ බුදුහාමුදුරුවෝ කියනවා මිනිසුන් වර්ග 04 ක් ඉන්නවා කියලා. එකක් තමුන්ගේ අපිරිසිදුකම දන්නේ නැති අය. සමහර අය ඉන්නවා අපිරිසිදු කම දන්නවා. සමහර අය ඉන්නවා පිරිසිදුකම දන්නවා. සමහර අය පිරිසිදුකම දන්නේ නැහැ. මේ මුල් කොටස් දෙකම බුදු හාමුදුරුවෝ හඳුන්වන්නේ හීන පුරුෂ කියලා. ඒකෙන් අදහස් වෙන්නේ තමුන් දන්නවා නම් තමන්ගේ මනස පිරිසිදු නැහැ කියලා. ඒක දැන ගත්තායින් පස්සේ එයාට පුළුවන් වෙන්න ඕනේ එකෙන් මිදෙන්න. මේ මිදීමේ අවශ්‍යතාවක් අද සමාජයට ඇති වෙන්න ඕනෑ. ඒ සඳහා රටට අවබෝධය අවශ්‍යයි. සතිය අවශ්‍යයි. පොහෝය දවසට විහාරස්ථානයට ඇවිත් ශීලය ප්‍රගුණ කළ යුතු වන්නේ මානසිකව විසුද්ධිය හෝ පිරිසිදුකම ඇති කර ගන්නයි. සිත අපිරිසිදු වෙලා. ඒක හදා ගන්න උවමනායි යන්න කෙනෙකුට දැනෙන්න අවශ්‍යයි. නමුත් ඒ අවශ්‍යතාවය තිබුණට කාලාන්තරයක් තිස්සේ අනුගමනය කළ පුරුදු විසින් ඔහුව වට කර ගන්නවා. වසා ගන්නවා.

*ප්‍රශ්නය : ඔබ වහන්සේට පෙනෙන විදියට දැන් තියෙන තරුණ සහභාගීත්වය කොහොමද? ඔබ වහන්සේගේ පන්සලේ අත්දැකීම අනුව?*

පිළිතුර : මගේ අත්දැකීම අනුව මම දකිනවා තරුණ පිරිස දෙස සෑහෙන සුබ වාදීව දකින්න පුළුවන්. විහාරයට පැමිණීමේ රුචිකත්වය වැඩියි. ඒ වගේම දහම දැනගැනීමේ අභිරුචියත්, කැමැත්තත් වැඩියි. ඒ වගේම තමන්ගේ ජීවිතයේ යම් කිසි වෙනසක් කරන්න ඕන කියන එකත් ඒ අය ළඟ තියෙනවා. මම හිතනවා ඒ අයගේ ඒ අවශ්‍යතාව හඳුනාගෙන කටයුතු කරන්න හැකි නම් විශාල වෙනසක් ඇති කරන්න පුළුවන්.

*ප්‍රශ්නය : ඔබ වහන්සේට පෙනෙන අන්දමට ඉදිරියට යන විට තරුණ තරුණියන්ට මේ තියෙන මට්ටමට වඩා යම් කිසි යහපත් අනාගතයක් ඇතිවේවි කියලා හිතනවාද? තරුණයන් රටේ නායකත්වය ගන්න විට නැත්නම් ඉදිරියට යනවිට ඒ අයගේ චරිත වෙනස් වේවිද?*

පිළිතුර : චරිත වෙනස් වෙන්න පුළුවන්. මොකද අද හැම දෙයක්ම සාපේක්ෂකයි. අද යම් කිසි හැඟීමක් සිත තුළ තිබුණත් පාරිසරික වශයෙන්, ඔවුන් ලබන යම් යම් කටුක අත්දැකීම් මත ඒ වෙනස ඇති වෙන්නට පුළුවන්. සමහර විට අද ඉන්න වයෝවෘද්ධ අය තරුණ කාලයේදී හොඳ නිවැරදි චින්තනයක් තිබුණ, ඒ සඳහා හොඳ උත්සාහයක් ගත්ත පිරිසක් වෙන්න පුළුවන්. නමුත් යම් යම් අත්දැකීම් හා විවිධ දේවල් නිසා ඔවුන් වෙනස් වෙලා. ඒ නිසා තරුණයන්ට වෙනස් නොවන පරිසරයක් බිහි කිරීමයි අපිට අවශ්‍ය වෙන්නේ.

*ප්‍රශ්නය : සංස්කෘතියටත් අභියෝගයක් එල්ල වෙනවා. එය ගෝලීයකරණය හරහා සිදුවන දෙයක්. සමාජය ගෝලීය කරණයට මුහුණ දෙනවා. නමුත් අපේ අනන්‍යතාවයත්, අපේ සංස්කෘතියත්, ධර්මයත් රැක ගෙන ලෝකයට මුහුණ දෙන්න අපිට නොහැකි වෙලා තියෙනවා. ඒ බව විද්‍යුත් මාධ්‍ය දෙස බැලුවොත් පැහැදිලිව පෙනෙනවා ඒ හරහා සමහර වේලාවට එක එක අන්තවාදී කොටස් බිහි වෙනවා. ඒ අය ගෝලීයකරණයටත්, හැම එකකටමත් විරුද්ධ වෙනවා. හැම එකම ප්‍රතික්ෂේප කරනවා. මධ්‍යස්ථ මාවත අපිට තාම හොයා ගන්න බැරි වෙලා තියෙනවා. අපි කොහොමද එයට මුහුණ දෙන්නේ?*

පිළිතුර : ඇත්ත වශයෙන්ම මධ්‍යස්ථ භාවය නිර්මාණය කරන්න අධ්‍යාපනය, ආගමික චින්තනය, ඒ වගේම පරෝපදේශනය යන කරුණු තුනම ඒකාබද්ධ වෙලා. එහෙම ක්‍රියාත්මක නොවුණොත් එහෙම මම හිතනවා අපිට යම් යම් නරක දේවල් අසන්නට, දකින්නට සිද්ධ වේවි. එක පැත්තකින් මාධ්‍ය, අද ඉතාමත් ප්‍රබල ආයතන. මිනිසුන් වෙනස් කරන්න පුළුවන්. ඒ මාධ්‍ය තුළින් මධ්‍යස්ථභාවයේ වටිනාකම පිළිබඳව අපි හරි පණිවිඩයක් ගෙනගියොත් අපිට ඒ අයගේ බුද්ධිය වර්ධනය කරන්න පුළුවන්. පුද්ගලයෙක් මධ්‍යස්ථ වෙනවා කියන්නේ බුද්ධිමත් වෙනවා කියන එක. ඒක බුද්ධිය හා බැඳුණු එකක්. ඒ නිසා ජනතාවගේ බුද්ධිය වර්ධනට උවමනා කරන දේ තමයි අපි ක්‍රියාත්මක කරන්න මහන්සි වෙන්න අවශ්‍ය එක දෙයක්, අපි හැම දෙනෙක්ම මාධ්‍ය හෝ වේවා වෙනත් කලාවන් හෝ වේවා ඒ හැම එකක්ම අපේ මිනිස් ජීවිතයේ අමු පැත්තට තමයි කථා කරන්නේ. අමු පැත්ත කියලා කියන්නේ අපේ සිතේ තියෙන නොපැසුණු, උද්වේගකාරී පැත්තට. අපේ වගකීම විය යුත්තේ ඒක නෙමෙයි. අපේ මිනිසුන්ගේ සිත් තුළ අභිප්‍රේරණ දෙකක් තියෙනවා. හොඳට යන අභිප්‍රේරණය හා නරකට යන අභිප්‍රේරණය. එතකොට මේ මාධ්‍ය හා අනෙකුත් කලා කථා කරන්න වැඩිපුරම මහන්සි ගන්නේ මේ නරකට යන අභිප්‍රේරණයට.

*ප්‍රශ්නයඃ සමබරව ඒ පාලනය කරන්නේ කොහොමද? රජයට තියෙන යුතුකම මොකක්ද? මේ ආයතන වලටත් යුතුකමක් ඇති. ඒ වගේම සමාජයටත් යුතුකමක් ඇති.*

පිළිතුර ඃ මම හිතනවා හැම දෙනාම ඒ වගකීම දරන්න අවශ්‍යයි. පාලකයන් හැටියට යම් කිසි ආයතනයක් පාලනය කරන හැම අංශයක්ම ඒ වගකීම දරන්න උවමනායි. හැම අවස්ථාවෙම තමුන් හිතනවානම් හරි මම කථා කරන්නේ මගේ පවුලේම පුතාට, මගේ පවුලේම දුවට කියලා ප්‍රශ්නය විසඳෙනවා.

*ප්‍රශ්නය ඃ ඒක නම් හරියට හරි. ගෝලීයකරණය හරහා එන විශාලම අභියෝගය එයයි. එයට මුහුණ දෙන්න අපේ සමාජය තුළ ශක්තිමත් පදනමක් තියෙන්න අවශ්‍යයි. දැන් තව පැත්තක් බැලුවොත් ස්වාමින්වහන්ස, තායිලන්තය හා ශ්‍රී ලංකාව අතර බුද්ධාගම ඉදිරියට යන ආකාරය පිළිබඳව අපිට සුභවාදි හෝ අසුභවාදි වශයෙන් තායිලන්තයෙන් ඉගෙන ගන්න පාඩම් තියෙනවාද?*

පිළිතුර ඃ තායිලන්තයේ ස්වාමින්වහන්සේලාට, බෞද්ධ ජනතාවට වගකියන ආගමික නායකත්වයක් ඒ රටේ තියෙනවා. ඒ සංඝරාජ හාමුදුරුවෝ. සංඝරාජ හාමුදුරුවන්ගේ අභිප්‍රායයන් හා ශාසනික අවශ්‍යතා ක්‍රියාත්මක කරන ආරක්‍ෂා කරන තවත් ඒකකයක් තියෙනවා. ඒ තමයි රජ්ජුරුවෝ. ඒ නිසා ඒ රටේ බුද්ධාගමේ ප්‍රබෝධය සහ ආරක්‍ෂාව හොඳට තහවුරු වෙලා. අපේ රටේ ඒ ස්වභාවය නැති නිසා යම් යම් ප්‍රශ්න පැන නැගිලා. මම හිතනවා ශාසනික වශයෙනුත් අපිට ඍජු ඒකීය නායකත්වයක් නැහැ. ඒ නිසා ඒක රාශී වෙන්න ඕන.

*ප්‍රශ්නය ඃ ඒ ගමන අපිට යන්න පුළුවන් වෙයිද? කොහොමද ඒක කර ගන්නේ.*

පිළිතුර ඃ ඇත්තටම අනතුර දකිනවා නම්, අවශ්‍යතාවය තියෙනවා නම් හදා ගන්න පුළුවන්. අනතුර දකින්නෙත් නැහැ. අවශ්‍යතාවයක් ඇත්තෙත් නැහැ.

*ප්‍රශ්නය ඃ ඒ වගේම සමාජය පැත්තෙන් තායිලන්තයේ තියෙනවා තරුණන් තාවකාලිකව මහණ වෙන අදහස. ඔබ වහන්සේ ඒ ගැන මොකක්ද හිතන්නේ?*

පිළිතුර ඃ මම හිතනවා ඒක හොඳ දෙයක්. ඕනෑම කෙනෙක් මහණ ජීවිතයේ, ශාසනික ජීවිතයේ පුහුණුවක් ලබා ගන්න එක හොඳයි. එයින් ගැඹුරු අවබෝධයක් ලබා ගන්න පුළුවන් කම ලැබෙනවා. මානසික වශයෙන් තමන් ට ශක්තියකුත් ඇති වෙනවා. මගේ ජීවිතයේදී මම අඩුම වශයෙන් පැවිදි වෙලා හිටියා කියලා. ඒක හොඳ ආගමික අත්දැකීමක්.

*ප්‍රශ්නය : අපේ සමාජය කොහොම ඒ දෙස බලයිද?*

පිළිතුර : අපේ සමාජයේ යම් යම් ආයතන මහන්සි ගත්තා තාවකාලික පැවිද්ද ආදේශ කරන්න. නමුත් සාර්ථක වුනේ නැහැ. අපේ රටේ ඒ පුරුද්ද නැහැ. අලුත් දෙයක් වැළඳ ගන්න අපේ අය රුචිකමක් දක්වන්නේත් නැහැ. කාලාන්තරයක් තුළ තමයි කෙනෙකුගේ කැමැත්ත හෝ රුචිකම නිර්මාණය වෙන්නේ. ඒ නිසා සියයට සියයක් සාර්ථක වුණේ නැහැ.

***ප්‍රශ්නය : මට නිතරම පෙනෙන විදියට අපේ සමාජයේ තියෙන එක ප්‍රශ්නයක් තමයි අලුත් අදහස් ඉදිරිපත් කරන කොට එක වරම කුමන්ත්‍රණයක් ලෙස සැක කිරීම. අපේ සමාජය නිතරම වෙන ආකාරයට බලන්නේ. හරි අකමැතියි අලුත් විදියට බලන්න. දැන් ඉන්දියාවේ, තායිලන්තයේ වෙන්න පුළුවන් මේ ප්‍රශ්න ගැන විවෘතව කථා කරනවා. සංවාදයක් තියෙනවා.***

පිළිතුර : අපේ රටේ බොහෝ දෙනා පාරම්පරික අදහස් වලට නැඹුරු අය. ඒ නිසා අලුත් අදහසක් දුන්නොත් ඒකට එකතු වෙන්නේ නැහැ.

උදාහරණයක් හැටියට මීට අවුරුදු අටකට පමණ කලින් මම කල්පනා කළා විවාහ ජීවිතයේ මංගල අවස්ථාව පන්සල ඇතුලේ කරන්න චාරිත්‍රයක් වශයෙන් ඉඩ දුන්නොත් හොඳයි කියලා. එවිට ආගමික ආශිර්වාදය ඒකාන්ත වශයෙන්ම ලැබෙනවා. අනවශ්‍ය වියදම නැති කර ගන්න පුළුවන්. නමුත් ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා අනවශ්‍ය, විවිධ චෝදනා එල්ල වුණා. මොකද මේ අලුත් අදහස දකින්නට ඇතැම් අය කැමැත්තක් නැති නිසා. සමහර අයට කැමැත්තක් නැහැ. සමහර අයට උවමනාවක් නැහැ. තවත් සමහර අයට තමුන්ගේ ජීවිතය තුළ ඒ අත්දැකීම ලැබෙන්නේ නැති නිසා තව කෙනෙකුට උරුම කරන්නටත් අකමැත්තක් තියෙනවා.

***ප්‍රශ්නය : අපේ සමාජය හරි බයයි. විවේචනය කළොත් දරා ගන්න ආත්ම ශක්තිය නැහැ. ආත්ම විශ්වාසය නැහැ. නැත්නම් සුළු පිරිසකගේ මතයට එක වරම යටත් වෙනවා. ඒ වෙනස් කම් වලට මුහුණ දෙන්න නායකත්වය අවශ්‍යයි. සිවිල් සමාජයේ, දේශපාලන සමාජයේ වෙන්න පුළුවන් ඒ වගේම එකතු වී එක නායකත්වයක් යටතේ මෙම තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍යයි. ඒ ස්වභාවය බිහි කරන්න ක්‍රමයක් තියෙනවාද?***

පිළිතුර : මම හිතන විදියට නම් එය දිර්ඝ කාලීන වැඩපිළිවෙක් අනුව සිදු කරන්න අවශ්‍යයි. මිනිසුන්ගේ චින්තන රටාව වෙනස් කරන වැඩපිළිවෙලකට යන්න උවමනායි. ඒ කියන්නේ මිනිසුන්ගේ ගතානුගතිකත්වයට දක්වන අනවශ්‍ය

කැමැත්ත නැති කරන, ඔහුව බුද්ධිමත් කරන යම් කිසි ක්‍රියාදාමක් කරන්න සිදු වෙනවා. ඒක අපි සියුම් විදියට කරන්න අවශ්‍යයි. පාසල් පද්ධතිය තුළ, දහම් පාසල් තුළ, ඒ වගේම බුද්ධිමය සංවාද තුළ මෙය සිදු කරන්න පුළුවන්. යමක් නිවැරදි නම් ඒ නිවැරදි දේ භාවිතා කරන්න අපි නිර්භය විය යුතුයි එවිට මම හිතනවා කාලන්තරයක් යන විට එහි එකේ ප්‍රතිඵල අපට නෙලා ගන්න හැකි වෙනවා.

*ප්‍රශ්නය : අනෙක් පැත්තෙන් බලන විට මහා සංඝ රත්නයටත්, පිරිවෙන් අධ්‍යාපනය හරහා අභියෝග තියෙනවා. ඒ පැත්ත බැලුවොත් මොනවාද තියෙන අනාගත අභියෝග?*

පිළිතුර : ස්වාමීන් වහන්සේලා සම්බන්ධව යම්කිසි අධ්‍යාපන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න සිදු වෙනවා. දැන් තියෙන අධ්‍යාපනය හුදු දැනීම සඳහා නිර්මාණය වූ අධ්‍යාපනයක්. ඒක නෙමෙයි වෙන්න අවශ්‍යය. අධ්‍යාපනය කියන එක දැනීම පමණක් නොවෙයි ඔහුගේ චර්යාව වෙනස් කරන එකක් විය යුතුයි. මම උදාහරණයක් කියන්නම්. අපේ තියෙනවා සතර සංග්‍රහ වස්තු. එහි සඳහන් වෙනවා කාරණයක් ප්‍රිය වචනය. බෝධි සත්ව චර්යාව දිහා බැලුවාම බුදුවරයෙකු දස පාරමිතා පුරලා ඊලඟට ඔහුගේ පාරමිතා වල භූමි තියෙනවා. දස භූමි කියලා. ඒ හැම භූමියකදීම බෝධිසත්ව වරයෙකු ඔය කියන සතර සංග්‍රහ වස්තු පෝෂණය කරනවා. ඒ කියන්නේ ප්‍රිය වචනය, දානය, අත්ථචරියාව සහ සමානාත්මතාවය. දැන් ප්‍රියවචනය කියන එක අපට පෙනෙන්නේ ඉතාමත් ලසු, වටිනාමක් නැති දෙයක් හැටියට. නමුත් එය බුදුවරයෙකු බිහි කිරීම සඳහා උපකාරක වන දෙයක්. සෞම්‍ය වචන කතා කරන්නේ කොහොමද? යම් කිසි කෙනෙකුට පැහැදීමක් ඇති වන ආකාරයෙන් කතා කරන්නේ කොහොමද? යන්න ගැන උගන්වන, ශික්ෂණයක් ඇති කරන ආයතනයක් අපට අවශ්‍යයි. ඒ දේ පිරිවෙන් අධ්‍යාපනයේ නැහැ. පාලි, සංස්කෘත, සිංහල භාෂාව, බුද්ධාගම උගන්වනවා. එහෙම නෙමෙයි යම් කිසි සියුම් වැඩපිළිවෙක් හදන්න ඕනේ. කොහොමද අපි මිනිසුන්ට ආමන්ත්‍රණය කරන්න උවමනා කියන එක පැහැදිලි කරන්න.

*ප්‍රශ්නය : තායිලන්තය දිහා බැලුවොත් ඒ සමාජය කොහොමද ඒ තත්ත්වයට මුහුණ දෙන්නේ?*

පිළිතුර : මම හිතන්නේ තායිලන්ත සමාජය තුළත් ඔය ශික්ෂණය ක්‍රියාත්මක කරන විධි ක්‍රමයක් නැහැ. නමුත් පාරම්පරිකව ගමන් කරන රටාවක් ඒ තුළ තිබෙනවා. මොකද සියලු දෙනාම කරන්නේ එකම විදියට. මං මුලින් කිව්ව පරමාදර්ශී සමාජය එහි නිර්මාණය වෙලා තියෙනවා.

*ප්‍රශ්නය : දැන් අපේ බොහෝ දෙනා කියන්න පුළුවන් අපි යටත් විජිත යුගයේ අවුරුදු 400 ක්, 500 ක් හිටපු නිසා අපේ අනන්‍යතාව සම්බන්ධ ප්‍රශ්න නිසා අපිට හරියට අනන්‍යතාවය ඇති කර ගන්න බැරි වුනා කියා. තායිලන්තයට ඒ ප්‍රශ්න තිබුණේ නැහැ. ඒ රටට හැකි වුනා යම් කිසි මට්ටමකින් ආරක්ෂාකාරීව සිටින්න. ඒකේ ඇත්තක් තියෙනවාද ස්වාමින්වහන්ස?*

පිළිතුර : ඇත්තක් තියෙනවා. මොකද ඒ අයට පුළුවන්කම ලැබිලා තියෙනවා පාරම්පරික දේ රැක කරගන්න. උදාහරණයක් හැටියට ශ්‍රී ලංකාවේ අපිට ම වෙන් වූ භාවනා ක්‍රමයක් තිබුණා. දැන් එය අපි අතරේ නැහැ. විදේශ ආක්‍රමණ සමඟ ඒ ක්‍රමය අස්ථානගත වෙලා.

*ප්‍රශ්නය : ඇයි අපිට උනන්දු වෙන්න බැරි ඒ දෙවල් ආපසු ලබා ගන්න?*

පිළිතුර : ප්‍රධානතම කාරණාව අපේම උරුමය නිර්මාණය කරන වැඩපිළිවෙලකට අවතීර්ණ වුනේ නැති කම. අනුන්ගේ එකක් අරගෙන ක්‍රියාත්මක කළා පමණයි.

*ප්‍රශ්නය : දැන් වුනත් අපේ උරුමය බිහි කරන්න පටන් ගන්නේ කොහොමද? එක පුද්ගලයෙක් දෙන්නෙක් එකතු වෙලා කරනවාද? සංවිධානාත්මකව කරනවාද?*

පිළිතුර : සංවිධානාත්මකව ඔක්කෝම එකට එකතු වෙලා. සාකච්ඡා කරලා විප්ලවීය ස්වභාවයකින් කරන්න වෙනවා. ඒ වගේම එතැනට එන්න අපට හොඳ නායකත්වයක් අවශ්‍යයි. ඒ නායකත්වය තුළ හිඳගෙන ගොඩනගා ගන්නා වූ විශ්වාසය කරන කොට ගෙන ඔය කියන පරිසරය ගොඩනගන්න පුළුවන්.

*ප්‍රශ්නය : අපේ ඉතිහාසය බැලුවොත් එහෙම එක එක යුග තිබුණා. එක එක ආකාරයට පරිවර්තන ඇති වෙලා තියෙනවා. රජවරු ඉදිරිපත් වුණා. නැත්නම් ස්වාමීන් වහන්සේලා හරහා යම් යම් වෙනස් කම් වුණා. ඔබවහන්සේට පෙනෙන විදියට මේ මොහොත ගැන කල්පනා කරලා ඉතිහාසය දිහා බැලුවොත් මොනවාද ඉගෙන ගන්න පුළුවන් පාඩම්.*

පිළිතුර : ඉතිහාසය පුරා අපට පෙනෙනවා යම් යම් චරිත. කාලීන අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ජනතාවට හෝ ශාසනයට දියයුතු නායකත්වය ලබා දුන්න චරිත අපට එමට හමුවෙනවා. ඉතිහාසය තුළ, මහා වංශය තුළ ඒවා උද්දීපනය වෙලා තියෙනවා. අද පරිසරය දිහා බැලුවොත් මට තවම එබඳු නායකත්වයක් හමුවෙලා නැහැ. සමහර විට සමාජයේ නායකයන් ජීවත් වෙනවා ඇති. නමුත් ඒ අයට ඉදිරියට එන්න අවකාශයක් නැහැ.

**ප්‍රශ්නය : ඉතිහාසය දිහා බැලුවොත් එහෙම - අපට නම් දෙකක් තුනක් ගැන හිතන්න පුළුවන් නම් මේ යුගයට - සියට සියයක් ගැලපෙන්නේ නැතිව ඇති - නමුත් අපට ආදර්ශවත් චරිත. ඉගෙන ගන්න පුළුවන් චරිත?**

පිළිතුර : අපි ශාසනික වශයෙන් සැලකුවහොත් එහෙම මෑත ඉතිහාසයේ සිටිනවා වැලිවිට සංඝරාජ හාමුදුරුවෝ. හොඳ නායකත්වයක් ලබා දුන්න චරිතයක්. ඒ නිසාම විප්ලවයක් වුණා සංඝ සංස්ථාවේ. අන්න ඒ වගේ යම් කිසි නායකත්වයක් අපි අපේක්‍ෂා කරනවා.

*ප්‍රශ්නය : ඉතිහාසයේ රජවරුන්ගෙන් අපිට ඉගෙන ගන්න පුළුවන්නම්?*

පිළිතුර : දුටු ගැමුණු රජ්ජුරුවෝ එක යුගයක අවශ්‍යතාවයක් සම්පූර්ණ කළා. පරාක්‍රමබාහු රජ්ජුරුවෝ තවත් අවශ්‍යතාවයක් සම්පූර්ණ කළා. 3 වන විජයබාහු රජ්ජුරුවෝ, වලගම්බා රජ්ජුරුවෝ විටින් විට ඒ යුගයට අවශ්‍ය කරන නායකත්වය ලබා දුන්නා. ඒ ඒ යුගවලදී මූලික සමාජ අවශ්‍යතාවය සම්පූර්ණ කරන පරිදි රජවරු බිහි වෙලා තිබෙනවා. ඒ රජවරු බොහෝ කැප වෙලා රටට නායකත්වය ලබා දීලා තිබෙනවා.

***ප්‍රශ්නය : අපට දිගු ඉතිහාසයක් තිබුණත්, අපේ එදිනෙදා ජීවිතයට ඒ ඉතිහාසය අදාල කරගෙන නැති බව පෙනෙනවා. ජපන් ජාතිකයෙකු සමග කතා කළොත් ඒ පුද්ගලයා නිතරම තමන්ගේ ඉතිහාසය ගැන කතා කරනවා. අපේ අහවලා මෙහෙම කලා. ඒක නිසා මේක අපට මෙහෙම බලපාන්න පුළුවන්. නමුත් අපේ රට ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්නේ නැහැ වගේ. ඔබ වහන්සේ එකඟද?***

පිළිතුර : ඔව්. මම එකඟයි. වෙනස තියෙන්නේ ජපන් ජාතිකයා තමන්ගේ ඉතිහාසයේ චරිත තමන්ගේ ජීවිතයට හැම වේලාවේම බද්ධ කර ගන්න මහන්සි ගන්නවා. අපේ රටේ අය හුදෙක් කතා වලට පමණක් සීමා කරලා තියෙන්නේ. අත්දැකීම් වලින් තවත් නායකත්වයක් නිර්මාණය කර ගන්න මහන්සි ගන්නේ නැහැ. ඒ දුර්වලතාවය තමයි අපට තියෙන්නේ. සමහර විට ඒ සඳහා උචමනා පරිසරය සමාජ ගතව නැති වීම හේතුවක් වෙන්නට පුළුවන්. කෙනෙකුට පෞර්ෂය අරගෙන, ලක්‍ෂණ අරගෙන චරිත වෙනස් කරගෙන ඉදිරියට ගියාට අවශ්‍ය පිළිගැනීම සමාජයෙන් ලැබෙන්නේ නැහැ.

***ප්‍රශ්නය : ආර්ථික පැත්තෙන් බැලුවොත් තායිලන්තයේ, ජපානයේ වගේ රට වලට පුළුවන් වෙලා තියෙනවා විවෘත ආර්ථික රාමුව තමාගේ සංස්කෘතියටත්, සමාජයටත් ගැලපෙන ලෙස නිර්මාණය කරගන්න. ඉන්දියාවත් එහෙමයි. ගෝලීයකරණය හරහා විශාල අභියෝග තියෙනවා. නමුත් අපිට එයත් හරියට කර***

*ගන්න බැරි වෙලා තියෙනවා. අපි රාමුව ගන්නවා. නමුත් අපි හදන්නේ අපට නොගැලපෙන වෙන සමාජයක් නිර්මාණය කරගන්න. අමරිකාව හෝ යුරෝපය වගේ හැසිරෙන්න. අපිට ම කියලා ශ්‍රී ලාංකික රාමුවක් හදා ගන්න බැරි වෙලා තියෙනවා. ඒක නිසා තමයි ආර්ථිකය පිළිබඳ නිතරම ප්‍රශ්න මතු වෙන්නේ. විවාද මතු වෙන්නේ. ඔබ වහන්සේට අදහස් තියෙවාද ඒ ගැන.*

පිළිතුර : මම හිතන විදියට දැන් කවුරු හරි කෙනෙක් එවාගේ ආර්ථික ප්‍රතිපත්තියක් සමාජයට හඳුන්වා දුන්නොත් හැමෝම මහන්සි ගන්නේ එකේ තියෙන දුර්වල පැත්ත ගැන කතා කරන්න. ධනාත්මක පැත්ත ගැන කතා කරන්න කවුරුත් පෙළඹෙන්නේ නැහැ. ඒක මේ රටේ තියෙන එක්තරා විදියක නරක සිරිතක්. ඕනෑම දෙයක හොඳ නරක මිශ්‍ර වෙලා තියෙනවා. ලෝකයේ කිසිම දෙයක් අංග සම්පූර්ණ නැහැ. මිනිසා නිර්මාණය කරන සෑම දෙයකම දෝෂයක් තියෙනවා. නමුත් අපි දකින්න අවශ්‍ය දෝෂය නෙමෙයි. යම් දෙයක තියෙන ගුණාත්මක පැත්ත. ධනාත්මක පැත්ත. ඒ තත්ත්වය අපට ඉස්මතු කරන්න පුළුවන්නම් අර මුලින් කී වැරදි පවා අපිට පසු කාලයකදී හදා ගන්න පුළුවන්. නමුත් අලුත් මතයක් ගෙනා ගමන් සමහරු ජනතාවගේ බුද්ධිය යොමු කරන්නේ එකේ තියෙන වැරදි පැත්තට. හොඳ පැත්ත ඒ නිසා කවදාවත් දකින්නේ නැහැ. හැම දෙයක්ම පටන් ගත්තු තැනම ලොප් වෙන ක්‍රමයක් තමයි ලංකාවේ තියෙන්නේ. එහෙම නෙමෙයි රටක නායකත්වය ගැන අපේ මිනිස්සු එක වකවානුවකට හරි විශ්වාසය ඇති කරගත යුතුයි. ගෙන යන ප්‍රතිපත්තිය තුළ මේ ප්‍රතිලාභ ලැබෙයි කියලා විශ්වාසය ඇති කර ගන්න උවමනායි. බුදුන්වහන්සේගේ දේශනාවල මුල්ම අදහස තමයි ශ්‍රද්ධාව. ශ්‍රද්ධාව තමයි ප්‍රඥාවේ දොරටුව. එනිසා මෙතැනදිත් විශ්වාසය ඇති කර ගන්න අවශ්‍යයි.

*ප්‍රශ්නය : ඒ වැදගත් පණිවුඩය අපි සමාජයට දෙමු. විශ්වාසයයි. ඉවසීමයි දෙකම වැදගත්. ස්තුතියි ස්වාමීන් වහන්ස.*

**ඍඍඎඎ**